# ජාතික පරිසර පනත සඳහා වූ රෙගුලාසි

## කේ. ධර්මරත්නම්

මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියාත්මක කිරීම 1988 අංක 56 දරණ සංශෝධන පනතින් සංශෝධිත වූ 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සඳහා වූ රෙගුලාසි ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස ජනාධිපති තුමා විසින් 90.01.08 වැනි දින සහතික කරනු ලැබූ අතර, අංක 588/9 සහ 89.11.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් අනතුරුව මෙකී රෙගුලාසි හැකි ඉක්මණින් ම අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබනවා ඇත.

ශ්‍රී ලංකාවේ පරිසරය තුළට අපද්‍රව්‍ය පිට කිරීම, නිශ්ධාපනය හා විමෝජනය වැළැක්වීමේ හා පාලනය කිරීමේ ලා වැදගත් පරිපාලන රෙගුලාසියක් වශයෙන් මේ ලේඛනය නම්‍යවීම ප්‍රායෝගිකවීම සහ ක්‍රියාත්මක කළ හැකිවීම යන ප්‍රතිපත්තිය මත සකස් වී ඇත. මේ රෙගුලාසි සරල ද පැහැදිලි ද වන අතර, බලපත්‍ර ලබාදීමේ කාර්ය පටිපාටිය ද පරිසරය අපද්‍රව්‍ය පිට කිරීම, නිෂ්ධාපනය සහ විමෝචනය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ප්‍රමිතීන් සහ උපමානයන් ද එමගින් නිශ්චිත ව දැක්වේ. මේ අයුරින් නීතිය ක්‍රියාවේ යෙදවීම සඳහා හොඳ ආරම්භයක් මේ රෙගුලාසි මගින් ඇති කෙරේ. අභ්‍යන්තර පෘෂ්ඨීය ජලය මතට අප වාහයන් පිට කිරීම පිළිබඳ සාමාන්‍ය ප්‍රමිතීන් සහ උපමානයන්, වාරිමාර්ග කාර්යයන් සඳහා වූ බිම් පෙදෙස්වලට කාර්මික අපවාහයන් පිට කිරීම පිළිබඳ අනුඡේට සීමා මුහුදු වෙරළබඩ පෙදෙස් තුළට කාර්මික සහ ගෘහ පරිවාහනයන් පිට කිරීම පිළිබඳ සීමාවන්, රබර් කර්මාන්ත ශාලා, පේෂ කර්මාන්තය සහ පදම්කිරීමේ කර්මාන්තය කෙරෙහි අපවාහයන් පිට කිරීම පිළිබඳ අනුඡේය සීමා ද ඇතුළත් රෙගුලාසි 15 ක් වේ.

මේ රෙගුලාසි පහත සඳහන් පරිදි කොටස් 5 කට බෙදේ

1. නියමිත ප්‍රමිතීන්, උපමානයන් සහ ඒවා යෙදෙන ආකාරය.
2. පරිසර ආරක්‍ෂණ බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය.
3. පරිසර ආරක්‍ෂණ බලපත්‍ර ප්‍රතික්‍ෂේප කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය.
4. ප්‍රතික්ෂේප කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනා කිරීම.
5. වෙනස්වීම් සහ අභිප්‍රේත වසා දැමීම ගැන දැනුම් දීමට බලපත්‍ර දරන්නා සතු වගකීම.

රෙගුලාසි තනනු ලැබ ඇත්තේ මූලික වශයෙන් 1988 අංක 56 දරන ජාතික පරිසර සංශෝධනය පනතෙන් අපේක්ෂිත පරිදි ය. පාරිසරික ගුණාංග පවත්වා ගැනීම සහ පාලන කිරීමත් අපවිත්‍රවීම වැළැක්වීම සහ පාලනය කිරීමත් පිළිබඳ ප්‍රමිතීන් රෙගුලාසි මගින් නියම කරනු ලැබ ඇත්තේ නීති යෙන් (23 ඒ වගන්තිය) නියමිත පරිදි ය. බලපත්‍රයක ආකෘතිය ද, සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි ද පරිසරය අපවිත කෙරෙන අපද්‍රව්‍ය පිට කිරීම, නිෂ්පාදනය සහ විමෝචනය සඳහා පුද්ගලයකුට නැතිවම බැරි දෙයක් වන වලංගු කාලසීමාව ද රෙගුලාසි මගින් නියම කරනු ලැබ ඇත්තේත් නීතියෙන් (23 බී වගන්තිය) නියමිත පරිදි ය.

ගාස්තු අය කිරීම ද අධිකාරියේ (මධ්‍යම පරිසර අධිකාරිය) තීරණයට එරෙහිව කෙරෙන අභියාචනා පිළිබඳ කාර්ය පටිපාටිය ද රෙගුලාසි මගින් නියම කරනු ලැබ ඇත්තේ නීතියෙන් (32 වැනි වගන්තිය) නියමිත පරිදි ය.

රෙගුලාසිවල වැදගත් ලක්ෂණ කිපයක් මෙසේ ය :-

(අ) 2(බී) රෙගුලාසියේ ව්‍යතිරේකය - "මෙහි (1 උපලේඛනයේ) නිශ්චිතව සඳහන් වන ප්‍රමිතීන්ට සහ උපමානයන්ට අනුකුල ව ක්‍රියා නොකරන බලපත්‍රධාරිය කුට නිශ්චිත කාල සීමාවක් තුළ දී පූර්වෝක්ත ප්‍රමිතීන්ට සහ උපමාන යන්ට අනුකූල වන ආකාරයට ක්‍රියාත්මක වැඩ සටහනක් එකී කාලසීමාව තුළ දී ක්‍රියාත්මක කර පෙන්වන ලෙස අධි කාරියේ හිමතය පරිදි නියමකරනු ලැබූ විට, ඔහු එකී කොන්දේසි පිළිපදින තාක් කල් එකී බලපත්‍රධාරියා රෙගුලා සියේ කලින් සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නාක් සේ සලකනු ලැබිය යුතු වේ."

ව්‍යුහමය වෙනස් කිරීම් ආදිය සිදු කොට රෙගුලසිවල නියමයන් මුළුමනින් සපුරාලන්නට කාලය ඇවැසි බලපත්‍රධාරි යකුට මෙ මඟින් සහන සැලසේ.

(ආ) 3 වැනි රෙගුලාසිය - "ග්‍රාහක පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව ගැන සලකා, යම් නිශ්චිත කර්මාන්තයක්, මෙහෙයුමක් හෝ ක්‍රියාවලියක් පිළිබඳව, මෙහි 1 වැනි උපලේඛනයේ නිශ්චිත ව දැක්වෙන ප්‍රමිතීන්ට සහ උපමානයන්ට වඩා දැඩි ප්‍රමිතීන් සහ උපමානයන් නියම කිරීමට " අධිකාරියට බලය තිබේ. ස්වභාව ධර්මයේ හදිසි වෙනස්වීම් හෝ විද්‍යාත්මක සංවර්ධනය හෝ හේතු කොට ගෙන හට ගන්නා යම් අනපේක්ෂිත හෝ සුවිශේෂ කරුණු පිළිබඳ අවශ්‍යතාවන් ඉටු කිරීම පිණිස මෙය සකස් කරනු ලැබ ඇත.

(ඇ) 4 වැනි රෙගුලාසිය - "බලපත්‍රයක් සඳහා කර ඇති ඉල්ලීමකට අදාළ වන කාර්ය යක් මෙහි 1 වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ප්‍රමිතීන්ගෙන් සහ උපමානයන්ගෙන් ආවරණය නොවන විටදී, එවැනි ඉල්ලීමක් පිළිබඳ ඇති යෝග්‍යතාව මත අධිකාරිය විසින් ඒ පිළිබඳ තීරණයක් ගනු ලබනු ඇති අතර, පරිසරය ආරක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් ඔහුට නිකුත් කරනු ලැබිය හැකි සියලු නියමයන් ඉල්ලුම්කරු විසින් පිළිපදිනු ලැබිය යුතු වේ." කලින් කලට තවදුර ප්‍රමිතීන් සහ උපමාන යන් නියම කිරීමට අධිකාරියට හැකිවන නොක් මතුවිය හැකි දුෂ්කරතා මඟ හරවා ගැනීම සඳහා මේ රෙගුලාසිය සැලසුම් කරනු ලැබ ඇත.

(ඈ) 6 වැනි රෙගුලාසිය - "බලපත්‍රයෙන් අවසර දෙනු ලැබ ඇති ක්‍රියාවන් සිදු කෙරෙන එක් එක් ස්ථානයක් සම්බන්ධ යෙන් බලපත්‍රයක් සඳහා වෙන වෙනම ඉල්ලීමක් කළ යුතු වේ."

(ඉ) 8 වැනි රෙගුලාසිය - බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි නැතහොත් අධිකාරියේ නෑප්තියට හේතුවන පරිදි සපුරාලිය යුතු අවශ්‍යතා :

(අ) පනතේ හෝ මේ රෙගුලාසිවල හෝ විධිවිධාන උල්ලංඝනය වන සේ බලපත්‍රය පාවිච්චි කරනු නො ලබනු ඇත.

(ආ) බලපත්‍රයෙන් අවසර දෙනු ලැබ ඇති ක්‍රියාවන්ගෙන් මිනිසාට හෝ පරිසරයට හෝ අප්‍රතිවර්ත්‍ය හානි යක් හෝ විපතක්වත් යම් පීඩාව ක්වත් සිදු නොවනු ඇත.

(ඇ) ඉල්ලුම්කරු පනතේ රෙගුලාසිවලට අනුව, පරිසරයේ ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පියවර ගෙන ඇත.

10 වැනි රෙගුලාසිය - බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ නියෝගයක් නිකුත් කිරීමට පෙර,

බඳු නියෝගයක් නිකුත් නොකළ යුත්තේ කවර හෙයින් ද යන වගට හේතු දැක්වීම සඳහා බලපත්‍රය දරන්නාට අවස්ථාවක් දුන් මනා බවට මේ රෙගුලාසිය සඳහා වූ ව්‍යතිරේකය **සැළකිය යුත්තකි**. බලපත්‍රය නිකුත් කරනු ලැබීමෙන් පසුව, ග්‍රාහක පරිසරය ස්වභාවික සාධක හේතු කොට ගෙන හෝ අන් ලෙසකින් හෝ වෙනස් වී හෝ මාරු වී ඇත්නම් නැතහොත් බලපත්‍රයේ ග්‍රාහක පරිසරය තුළට අපද්‍රව්‍ය නොකඩවා මුදා හැරීම, නිෂ්පාදනය සහවිභෝචනය යම් හිතකර භාවිතයක් කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත්නම් හෝ බලපෑ හැකිනම් හෝ අධිකාරිය විසින් අප්‍රමාදව ම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු කාල සීමාවක් සඳහා බලපත්‍රය අත්හිටුවීමේ නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු ය. නැතහොත් බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතුය යන ව්‍යතිරේකයට යටත් වේ.

(උ) 12 වැනි රෙගුලාසිය - බලපත්‍රය සඳහා ඉල්ලුම් පතේ දී ඇති විස්තරවල කිසියම් වෙනසක් වෙතොත් ඒ ගැන ද අපේක්ෂිත කාර්යාවසානය ගැන ද අධිකාරියට දැන්වීමට බලපත්‍රධාරියා බැඳී සිටී. බලපත්‍රධාරියා අප්‍රමාදවම,

(අ) බලපත්‍රය සඳහා සිය ඉල්ලුම් පත්‍රයට අදාළව සපයන ලද විස්තරවල සිදු කරන ලද හෝ සිදු කරනු ලැබීමට යෝජිත හෝ යම් වෙනසක්

(ආ) අවසන් කිරීමේ යම් තීරණයක් අධිකාරියට දැනුම් දී පරිසර දූෂණ උවදුරු වැළැක්වීම න්අඩු කිරීම හෝ සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් යම් නියමයන් පිළිපැදිය යුතු ය.

දැන් මෙකී රෙගුලාසි 'පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම පිළිබඳ මාර්ගෝපදේශන නමැති පොත් පිංචක් මගින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහජනයාගේ ප්‍රයෝජනය සඳහා පරිපාලනාත්මක වශයෙන් ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් සරල ලෙස විස්තර කර දෙනු ලබ ඇත.

සරල කොට දක්වනු ලැබ ඇති කාර්ය පටිපාටි සමහරක් දක්වනු කැමැත්තෙමි.

**අභිනව කර්මාන්තයක් / කාර්යයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යොදා ගනු ලබන කාර්ය පටිපාටිය**

* මේ කාර්යය සඳහා පිළියෙ කරනු ලැබ ඇති ඉල්ලුම්පතක් ආකෘතියක් මධ්‍යම **අධිකාරියෙන් හෝ අදාළ ප්‍රාදේශීය අධිකාරියෙන් හෝ** ලබා ගැනීම.
* සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ආකෘතිය මධ්‍යම පරිසර අධිකාරියට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දීමෙන් හෝ ඉදිරිපත් කිරීම.
* කර්මාන්තය / කාර්යය ආරම්භය කිරීමට මාසයකට කලින් ඒ බව **අදාළ ප්‍රාදේශීය අධිකාරිය** මගින් මධ්‍යම පරිසර අධිකාරියට දැනුම්දීම.
* තවදුර පරීක්ෂණයකින් පසුව, නියම කොට දක්වා ඇති කොන්දේසි දැඩිව පිළිපැද තිබෙන්න බවට අධිකාරිය සෑහීමට පත් වේ නම් එවිට, **කර්මාන්තය / කාර්යය ආරම්භ කිරීමට පෙරාතුව** මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලබනවා ඇත.

**පවත්නා කර්මාන්තයක් / කාර්යයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම උපදෙස් යොදා ගනු ලබන කාර්ය පටිපාටිය :**

* මේ කාර්යය සඳහා පිළියෙල කරනු ලැබ ඇති ඉල්ලුම්පත් ආකෘතියක් මධ්‍යම පරිසර අධිකාරියෙන් හෝ අදාළ ප්‍රාදේශීය අධිකාරියෙන් හෝ ලබා ගැනීම.
* සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ආකෘතිය මධ්‍යම පරිසර අධිකාරියට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාරදීමෙන් හෝ **1990 මැයි මස 1 වැනි දිනට හෝ ඊට පෙර** ඉදිරිපත් කිරීම.
* ඉල්ලුම්පත ඉදිරිපත් කරනු ලැබූ පසු, කර්මාන්තය / කාර්යය ක්‍රියාත්මක කිරීමෙන් ඇතිවිය හැකි පරිසර දූෂණයේ ස්වභාවය සහ ප්‍රමාණය පදනම් කොට ගෙන කර්මාන්තය / කාර්යය අධිකාරිය විසින් වර්ග කෙරෙනු ඇත.
* පූර්වෝක්ත වර්ගීකරණය පදනම් කොට ගෙන **අධික පරිසර දූෂණයක් ඇති කරන ඝනයට අයත් වන කර්මාන්ත / කාර්යයන් සඳහා බලපත්‍ර මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇති අතර, මධ්‍යම ප්‍රමාණයේ සහ අඩු ප්‍රමාණයේ දූෂණයක්** ඇති කරන ගණයට අයත්වන ඒවා සඳහා වූ ඉල්ලුම්පත්, **බලපත්‍ර නිකුත් කරනු පිණිස අදාළ ප්‍රාදේශීය අධිකාරිය වෙත යොමු කරනු ලබනවා ඇත.**
    * ප්‍රාදේශීය අධිකාරිය එකී කාර්යයන් අධිකාරිය විසින් නිශ්චිතව දැක්වෙන මාර්ගෝපදේශ වලට අනුව කරනු ඇත.
    * මධ්‍යම පරිසර අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබීමේ දී පහත සඳහන් කාර්ය පටිපාටිය යොදා ගනු ලබනවා ඇත.
    * අධිකාරියේ නිලධාරීන් විසින් කර්මාන්තය / කාර්යය පරීක්ෂා කරනු ලැබිය යුතු වන අතර, ඒ සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇත. ගාස්තුව යථා කාලයේ දැනුම් දෙනු ලබනවා ඇත.
* අදාළ පරීක්ෂා කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසුව, අධිකාරියේ නිලධාරීන් විසින් කර්මාන්තර / කාර්යය පිළිබඳ පරීක්ෂණයක් කරනු ලබනවා ඇත.
* ඉන්පසු කර්මාන්තයේ / කාර්යයේ මෙහෙයුම කරන කොට ගෙන පිට කරනු ලබන / නිෂ්පාදනය කරනු ලබන දූෂණ පිළිබඳව සහ එහි මෙහෙයුමට ආනුෂංගික වශයෙන් මතු වී තිබිය හැකි වෙනත් පාරිසරික බලපෑම් පිළිබඳව අධිකාරිය විද්‍යාත්මක තක්සේරුවක් කරනු ඇත.
* එබඳු තක්සේරුවකින් පසු, එකී කර්මාන්තයේ / කාර්යයේ මෙහෙයුම්, අධිකාරිය විසින් නියම කරන ලද ප්‍රමිතීන්ට සහ උපමාන යන්ට අනුව සිදු කරනු ලබමින් තිබෙන බවට අධිකාරියට සෑහීමට පත් වේ නම් බලපත්‍රයක් නිකුත් කරනු ලබනවා ඇත. බලපත්‍රය ලබාගැනීම පිණිස රු. 750/- ක ගාස්තුවක් අධිකාරියට ගෙවනු ලැබිය යුතු වනු ඇත.
* යම් හෙයිකින්, අධිකාරිය සෑහීමට පත් නොවේ නම්, පරිසර දූෂකයන් **අධිකාරිය විසින් නියම කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුගත තත්ත්වයට ගෙන එනු පිණිස** ඒවා ගැන ක්‍රියා කිරීම සඳහා කාල නිශ්චිත වැඩ සටහනත් ගැන ඔබට දන්වනු ලබනවා ඇත.
* ඉහත සඳහන් කරන ලද කාලසීමාව තුළින් ඔබ නියමිත දූෂණ පාලන ක්‍රම ක්‍රියාවට නැඟීමේ ප්‍රගතිය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියට හෝ අදාළ ප්‍රාදේශීය අධිකාරියට හෝ දැනුම් දිය යුතු වේ.
* **මේ කාර්යය සඳහා අවශ්‍ය තාක්ෂණ විද්‍යා මාර්ගෝපදේශ ලබාගත හැකි අදාළ ආයතන** කෙරෙහි අධිකාරිය ඔබව යොමු කරනවා ඇත.
* මෙබඳු තාක්ෂණ විද්‍යා මාර්ගෝපදේශ පිළිබඳ යම් ගාස්තුවක් වේ නම් ඔබ එය දැරිය යුතු වනු ඇත.

7 පිටුවෙන්.

වෙනුවට තාක්ෂණය පදනම් කරගත් කර්මාන්ත ඇති කිරීම ය. පරිසර දූෂකයන්ට දඩ ගෙවීමට සිදුවන පරිදි පරිසර දූෂණය පිළිබඳ සම්මතයන් ක්‍රියාත්මක කළ යුතු ය. විෂ සහිත අප ද්‍රව්‍ය පාලනය ද නිරීක්ෂණය කළ යුතු ය.

* බලශක්ති පරිසර තුලනය පිණිස (න්‍යෂ්ටික, පොසිල, ඉන්ධන) විනාශ බලශක්තිකම සහ (26 ආදී) සාම්ප්‍රදායික බලශක්ති ක්‍රම පරීක්ෂා කළ යුතුව ඇත. බලශක්ති සංරක්ෂණය සහ බලශක්තිය කාර්යක්‍ෂමව යොදා ගන්නා උපකරණ සහ ක්‍රියාවලීන් උනන්දු කරවීම, ප්‍රතිපත්ති මගින් කළ යුතු අතර, වඩා පිරිසිදු පොසිල ඉන්ධන යොදා ගැනීම, දුගී ජනතාවගේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම, බලශක්තිය පිළිබඳ ප්‍රශ්න ලෝකය පුරා පැතිරියාම, පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත්, පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්තිවල විවිධ අංශයන් ය.

* මහජන සහභාගිත්වය සහ අධ්‍යාපනය, පරිසරය අනුව සළකන විට ස්ථාවර වූත් පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනයේ එක් වැදගත් යෙදවුමකි. පරිසර අධ්‍යාපනය, පාඨශාලාවල විෂය මාලාවේ එක් කොටසක් විය යුතු ය. පරිසරයේ අගය වටහා දීමටත්, තොරතුරු පතුරුවාලීමටත්, ආගමික සංවිධාන සහ ජනමාධ්‍ය උනන්දු කරවිය යුතු ය. රාජ්‍ය නොවන සංවිධානවල වැඩ කටයුතු ද සවිමත් කළ යුතු ය.

* පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත්, පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය සඳහා ජාතික සහ අන්තර් ජාතික යන මට්ටම් දෙකෙහි ම ආයතනික සහ නෛතික රාමුවක් අවශ්‍ය වන්නේ ය. පරිසරයේ ගුණාත්මක භාවය පිළිබඳ ඉලක්ක ව්‍යවස්ථා මඟින් බලාත්මක කළ යුතු ය. පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය පිළිබඳ සැළකිය යුතු කරුණු එක් අතකින් ජාතික ක්‍රම සම්පාදනය සහ අයවැය ක්‍රියාවලීන්ට ද, අනෙක් අතට ව්‍යාපෘති සැළසුම් සම්පාදනය, සැළසුම් සහ ක්‍රියාත්මක කිරීමට ද ඒකාබද්ධ කළ යුතු ය. පරිසරය ගැන උනන්දුවක් දක්වන කලාපීය ආයතන ද සවිමත් කළ යුතු ය.

පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය සඳහා අන්තර් ජාතික ආධාර අවශ්‍ය වන්නේ ය. එබඳු බාහිර වශයෙන් මුදල් යොදවනු ලැබූ පියවර මගින්, පරිසරය සහ සම්බන්ධ කටයුතුවලට ලබා දෙන මුදල් ප්‍රමාණය වැඩි කළ යුතු ය. කලාපීය පරිසර ආරක්ෂක අරමුදලක් ද පිහිටුවිය යුතු ය.

**අවසාන නිරීක්ෂණ**


තිර පවත්වා ගෙන යාහැකි සංවර්ධනය සම්බන්ධයෙන් ඉහත දක්වන ලද නිරීක්ෂණයන් බොහෝමයක් පරිසරය අනුව සළකන විට ස්ථාවරවූත්, පවත්වා ගෙන යාහැකිවූත් සංවර්ධනය සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය. එස්කැප් සම්මන්ත්‍රණය වූ කලී, දියුණුව කෙරේ වැඩි අභිලාෂයකින් යුත් එකකි. පරිසරය සහ සංවර්ධනය හා බැඳුණු ප්‍රශ්න සහ ගැටළු විවිධ අංශ අතරේ පැතිර පවත්නාවූ ද, විහිදී ගිය සම්බන්ධතාවන්ගෙන් යුක්ත වූ ද නිසා හැම අංශයකින් ම ප්‍රගතියක් ලබා ගැනීම දුෂ්කර කාර්යයකි. එම නිසා එක් එක් රට විසින්, ප්‍රධාන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ඇතුළත් ක්‍රියාත්මක කළ හැකි ගොනුවක් ප්‍රවේශමෙන් සැළසුම් කළ යුතු ය. පරිසරය අනුව සළකන විට ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකිවූත් සංවර්ධනය එක් අතකින් දුගී බව පිටු දැකීම සහ මූලික අවශ්‍යතාවන් සළසාදීම කෙරෙහි ද අනෙක් අතට, (ජාතික සහ සමස්ත ලෝක යන දෙයාකාරයේ ම) සමාජයේ වඩාත් ධනවත් කණ්ඩායම් විසින් පරිසරය අනිසි පාවිච්චිය යොදා ගැනීම කෙරෙහි ද උනන්දුවක් දක්වන හෙයින්, පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය ඊට සම්බන්ධ දේශපාලන ප්‍රශ්න සහ බලය පිළිබඳ ගැටළු මගින් අවදානමට ලක් කෙරේ. සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රයෝජනයට ගැනීමේ දී ද, තේරීම් සහ තීරණ කිරීම අවශ්‍ය වේ. පරිසරය අනුව සළකන විට ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකිවූත් සංවර්ධනය ඇත්ත වශයෙන් ම ක්‍රියාත්මක කිරීමේ දී, එසේ තේරීම් සහ තීරණ කිරීම, සීමිත විකල්පයන් ඇති තුන්වන ලෝකයේ රටවල්වලට දුෂ්කර වන්නේ ය.

අනෙක් අතට, පොහොසතුන් සහ දුප්පතුන් විසින් එකම ආකාරයට මුහුණ පා සිටින (රට අභ්‍යන්තරයේ සහ සමස්ත ලෝකයේ) ප්‍රශ්න සහ ගැටළු, හැම කණ්ඩායමකම ප්‍රබද්ධ සංවර්ධනය පදනම් කරගෙන ප්‍රමාණ වත් වැඩ සටහනත් මුලින් ආරම්භ කිරීම පිණිස හමුවන ස්ථානයක වන්නේ ය. සම්පත් පාවිච්චිය, බලශක්තිය, පරිසරය සංරක්ෂණය, පරිසර දූෂණය, ප්‍රතිසම්පාදනය කළ නොහැකි සම්පත් හිඟය, සාගර සම්පත් සහ (නීත්‍යානුකූලව සහ නීත්‍යානුකූල නොවන) ජනගහණ සංක්‍රමණය යන ප්‍රශ්න රාශියක් ම ධනවත් සහ දුප්පත් රටවලට එකසේ බලපාන්නේ ය. කලාපය පුරා පරිසර ව්‍යසනයන් නැවත නැවත ඇතිවීම සහ පිළියම්, ක්‍රියා මාර්ග ගැනීමේ අවශ්‍යතාවය ද, පවත්වා ගෙන යාහැකි සංවර්ධනය සහ පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත්, පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය වැඩ සටහන් සහ ව්‍යාපෘති ක්‍රියාමාර්ග යන සම්ප්‍රේෂණ පටිවලට සම්බන්ධ කිරීමේ ජීවන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන්වල දී පවත්වා ගෙන යා හැකි බව අදාල වන බව ගැන සැකයක් නැත්තේ ය. අපගේ පරිසරයේ සම්පත් සීඝ්‍රයෙන් අඩුවීම, මිලියන 10 ක් ජනගහණය, 1985 දී පැවැති මට්ටමේ සිට 32% කින් අපගේ ශ්‍රම හමුදාව වැඩිවීම, වර්ෂ 2000 වනවිට තවත් 27,00,000 ක් දෙනා රැකී රක්ෂා අපේක්ෂාවෙන් සිටීම, තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවක් දිළිඳු බව දක්වන රේඛාවට පහළින් සිටීම යන සියලු ම කරුණු සඳහා, පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත්, පවත්වා ගෙන යාහැකිවූත් සංවර්ධනය පිළිබඳ උපාය මාර්ග සහ වැඩ සටහන් මගින් පිළියම් නොවරදවාම අවශ්‍ය වන්නේ ය. අපගේ පරිසර පද්ධතියේ අනතුරට භාජන වියහැකි බව සහ අස්ථායිතාවය ස්වභාවික විද්‍යාඥයන් විසින් නැවත නැවතත් පෙන්වා දී ඇත්තේ ය. වෙනස්වීම් සිදු වන්නා වූ සහ මානව ක්‍රියාවන් මගින් මෙම අස්ථායීතාවය වැඩිකර ඇත්තා වූ අවස්ථාවල දී වැහැරීමේ ප්‍රවනතාවක් පරිසර පද්ධතියට ඇත්තේ ය. අස්ථායී පරිසරයක දී වැහැරීම අඩුවීමට නොව වැඩිවීමට ඉඩ ඇති බවත්, එම වැඩිවීම ආර්ථික ව්‍යසනයන්ට සහ සාමාජික නොසන්සුන්තාවන්ට මඟ පාදන බව ස්වභාවික විද්‍යාඥයෝ දනිති. අපගේ පරිසරයේ දැරීම් හැකියාවට, අපගේ සංවර්ධන ප්‍රයත්නයන් හි දී ප්‍රධාන තැනක් හිමි වේ. මේ රටෙහි, කඩිනම් කළා වූ සහ අහිතකර අන්දමින් සැළසුම් කළා වූ සංවර්ධන වැඩ සටහන් නිසා ඇතිවන පාරිසරික ගැටළුවල පුළුල් ප්‍රතිඵල ගැන අපි හැම දෙනාම දනිමු.

අපගේ අනාගත ගැටළු සම්බන්ධයෙන් සළකන විට, අපට කිරීමට ඇති ප්‍රායෝගික තේරීම වනුයේ පරිසරය සහ සංවර්ධනය යන දෙකකින් එකක් තෝරා ගැනීම නොවේ. විවිධ පාරිසරික සම්භාව්‍යතාවන් සහ අපගේ පරිසර පද්ධතිය අනුව ඒවායේ බලපෑම ගැන ගවේෂණය කිරීම ද, පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත් පවත්වාගෙන යාහැකිවූත් සංවර්ධනය පිළිබඳ උපාය මාර්ග විසින් දක්වන ලද ඉතාම හොඳ තේරීම කිරීම අප විසින් කළ යුතුව ඇත. මේ ප්‍රයත්නයේ දී, අපගේ ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ නව ක්‍රම, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ නැවත ප්‍රයෝජනයට ගතහැකි පරිදි සකස් කිරීම, ප්‍රතිසම්පාදනය කළ නොහැකි සම්පත් සඳහා ප්‍රතිසම්පාදනය කළ හැකි සම්පත් ආදේශ කරගැනීම, හැම මට්ටමකදී ම වැඩි දියුණු කළ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමයක් සහතික කිරීම ද අවශ්‍ය වන්නේ ය. මෙම කර්තව්‍යය තුළින් පූර්ණ සංවර්ධන සැළැස්මක් තුළ සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ යථාර්ථ පුරුදු සහ පරිසරය කෙරේ නැඹුරු වූ උපාය මාර්ග ද පැන නඟිනු ඇත.

LIBRARY
Ministry of Environment &
Natural Resources.



LIBRARY
Ministry of Environment &
Natural Resources.